සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

Second Term Test - Grade 12 - 2018

විභාග අංකය .................................. **නර්තනය I පත්‍රය** කාලය පැය දෙකයි

වැදගත්
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

◈ **උපදෙස්: මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. 'හෙළ ගී මඟ' හා 'සිංහල තිත් තාල ක්‍රමය' යන ග්‍රන්ථ රචනා කරන ලද්දේ පිළිවෙළින්,
1. ජේ. ඊ. සේදරමන් හා ඩබ්ලිව්. ඩී මකුලොලුව යන මහතුන් විසිනි.
2. ඩබ්ලිව්. ඩී. මකුලොලුව හා වින්සන්ට් සෝමපාල යන මහතුන් විසිනි.
3. සරත් විජේවර්ධන හා ඩබ්ලිව්.ඩී. මකුලොලුව යන මහතුන් විසිනි.
4. ඩබ්ලිව්. ඩී. මකුලොලුව හා සරත් විජේවර්ධන යන මහතුන් විසිනි.
5. වින්සන්ට් සෝමපාල හා ජේ.ඊ. සේදරමන් යන මහතුන් විසිනි. (........)

02. 'තුරු රත්න සිරි ලෙසිනා .......... මෙය
1. මාත්‍රා 2 + 3 තාල රූපයට ගයන ප්‍රශස්ති ගායනයකි.
2. මාත්‍රා 3 + 4 තාල රූපයට ගයන සවරන් කවියකි.
3. මාත්‍රා 3 + 3 තාල රූපයට ගයන චාමර කවියකි.
4. මාත්‍රා 2 + 4 තාල රූපයට ගයන ප්‍රශස්ති ගායනයකි.
5. මාත්‍රා 3 + 4 තාල රූපයට ගයන ප්‍රශස්ති ගායනයකි. (........)

03. විභාවයන් මුල් කරගෙන අවධි වූ ස්ථායි භාව ප්‍රදර්ශනය කරලීම.
1. ව්‍යභිචාරිභාව වේ. 2. අනුභාව වේ. 3. රසභාව වේ.
4. සංචාරිභාව වේ. 5. විභාව වේ. (........)

04. 'තාක් තකට තරිකිට දොද් දොං' මෙම අඩව්ව නර්තනය කළ හැකි තාල රූපය වනුයේ,
1. සුළු මැදුම් දෙතිතය 2. මැදුම් මහ දෙතිතය 3. මැදුම් තනි තිතය
4. මහ තනි තිතය 5. සුළු මහ දෙතිතය (........)

05. 'කුං දිත් තත් දොංතක තරිකිට' මෙම සබරගමු දවුල් පදය වාදනය කළ හැකි තිත් රූපය වනුයේ,
1. දෙසුළු මැදුම් තුන්තිතය 2. සුළු මැදුම් දෙතිතය.
3. තුන් සුළු මහ සිව්තිතය 4. දෙසුළු මහ තුන්තිතය.
5. තුන් සුළු දෙමහ පස්තිතය. (........)

06. නිර්මාණාත්මක රංග ආභරණයක් සකස් කිරීමේදී වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ,
1. ආකෘති පසුබිම හා රූපය පිළිබඳව ය. 2. ඒ සඳහා සුදුසු ද්‍රව්‍ය හැඩතල හා වර්ණ පිළිබඳවය.
3. වටිනාකම හා ශිල්පක්‍රම පිළිබඳවය. 4. රංග ආභරණ වල මූලික හැඩතල පිළිබඳවය.
5. එම රංග ආභරණ සැකසීමට යොදාගන්නා අමුද්‍රව්‍ය පිළිබඳවය. (........)

07. 'අනේ මී මැස්සේ මල්රොන් ගෙන යන රිස්සේ' මෙය
1. උඩැක්කි කවියකි. 2. ගොයම් කවියකි. 3. පන්තේරු කවියකි.
4. නෙළුම් කවියකි. 5. පන් නෙලීමේ කවියකි. (........)

08. මංගර දෙවියන් ප්‍රධාන වශයෙන් පුද ලබන ශාන්ති කර්මය වනුයේ,
1. පහන් මඩුව ය. 2. කිරි මඩුව ය. 3. දොවොල් මඩුව ය.
4. කොහොඹායක් කංකාරිය 5. ගම්මඩුව ය. (........)

09. 'කුද ගත ගත ගත කුකුදත් තකුද ගජිං' මෙම කස්තිරම අන්තර්ගත ශාස්ත්‍රීය නර්තන අංගයකි.
1. කොතල පදය 2. මංගලම් 3. යක්කැනුම
4. යක්තුන් පදය 5. ආවැන්දුම (........)

10. දේවාල හා විහාර වල තේවා කටයුතු පිළිබඳ රොබට් නොක්ස් විසින් ලියා පල කරන ලද ග්‍රන්ථය වනුයේ,
1. මහා වංශය 2. සිහබා අස්න 3. එදා හෙළදිව
4. විදේශීන් දුටු පුරාණ ලංකාව 5. කුවේණි අස්න (........)

11. නුවණින් අධිපති ගණ දෙවියන් පිළිබඳ කියැවෙන වන්නමකි.
1. සුරපති වන්නම 2. ගණපති වන්නම 3. ගජගා වන්නම
4. මුසලඩි වන්නම 5. උදාර වන්නම (........)

12. කිරිමඩු ශාන්ති කර්මයේ කථා පුවතෙහි එන චරිතයකි.
1. වර්ණ අග මෙහෙසිය 2. මහ සම්මත බිසව 3. අසූපාල බිසව
4. රිද්දි බිසව 5. මැණික්පාල බිසව (........)

13. කාලය මැන දැක්වීම සඳහා යොදාගන්නා කුඩාම ඒකකය වන්නේ,
1. ග්‍රහ 2. මාත්‍රා 3. තාල සඥ්ඥා 4. විභාග 5. ආවර්ත (........)

14. 'රත් පියුම් වැනිමුඛ..... යන කවි පදයට අදාල තාල රූපය වනුයේ,
1. මැදුම් මහ දෙතිත ය. 2. මහතනි තිත ය. 3. මැදුම් තනිතිත ය.
4. සුළු මහ දෙතිත ය. 5. සුළු තතිතිත ය. (........)

15. 'ඒ බුදු රැස් කඳ තුන්ලොව විහිදූ' ............ මෙය
1. උඩැක්කිය කවියකි. 2. හටන් කවියකි. 3. මල් යහන් කවියකි.
4. නමස්කාර කවියකි. 5. සිරස පාද කවියකි. (........)

16. උඩරට නර්තන සම්ප්‍රදායේ 'කොතල පදය' නර්තනය කරනු ලබන්නේ,
1. සුළු තනි තිතටය. 2. මැදුම් තනි තිතටය. 3. මහ තනි තිතටය.
4. සුළු මහ දෙතිතටය. 5. මැදුම් මහ දෙතිතටය. (........)

17. 'නාට්‍ය ශාස්ත්‍රය' ග්‍රන්ථය රචනා කරන ලද්දේ,

1. නන්දිකේශ්වර යන් විසිනි.
2. ජේ. වික්‍රමසිංහයන් විසිනි.
3. භරතමුණිවරයා විසිනි.
4. ඇරිස්ටෝටල් විසිනි.
5. ආනන්ද වර්ධනයන් විසිනි. (........)

18. පරාක්‍රමබාහු රජතුමා විසින් නාටක ශාලා පක් ඉදිකළ බව සඳහන් වනුයේ,

1. චූල වංශයේ ය.
2. මහා වංශයේ ය.
3. ථූප වංශයේ ය.
4. සමන්ත පාදාසිදිකාවේ ය.
5. බෝධි වංශයේ ය. (........)

19. රවීන්ද්‍රනාත් තාගෝර් තුමා දෙවෙනි වර ලංකාවට පැමිණියේ,

1. 1930 වර්ෂයේ දී ය.
2. 1922 වර්ෂයේ දී ය.
3. 1934 වර්ෂයේ දී ය.
4. 1928 වර්ෂයේ දී ය.
5. 1911 වර්ෂයේ දී ය. (........)

20.



A



B

ඉහත A සහ B රූප වලින් දැක්වෙන්නේ,

1. වීර රසය හා භයානක රසයයි.
2. රෞද්‍ර රසය හා කරුණා රසයයි.
3. කරුණා රසය හා වීර රසයයි.
4. රෞද්‍ර රසය හා වීර රසයයි.
5. වීර රසය හා කරුණා රසයයි. (........)

21. දෙවොල් මඩුව, සූනියම් යාගය, රටයකුම ශාන්තිකර්ම වල රස නිෂ්පත්තිය දැකිය හැකි අවස්ථා ලෙස පිළිවෙළින්,

1. වඩිග පටුන, දොළහ පෙළපාලිය හා අඹ විදමන වේ.
2. රාමා මැරීම, අඹ විදමන හා වඩිග පටුන වේ.
3. අඹ විදමන, වඩිග පටුන හා දොළහ පෙළ පාලිය වේ.
4. දෙවොල් ගොඩබැසීම, අඹ විදමන හා වඩිග පටුන වේ.
5. අඹ විදමන, දොළහපෙළපාලිය හා වඩිග පටුන වේ. (........)

22. හත්වෙනි හා අටවෙනි පා සරඹ වල සරඹ නාමයන් වනුයේ,

1. පසුපෙර අඩිය හා දැල අඩිය වේ.
2. කරනම් අඩිය හා දැල අඩිය වේ.
3. දැල අඩිය හා කරනම් අඩිය වේ.
4. නුහුරු අඩිය හා කරනම් අඩිය වේ.
5. දෙපැති අඩිය හා නුහුරු අඩිය වේ. (........)

23. භාරතීය නැටුමේ නර්තන විලාශ දක්නට ලැබෙන ඓතිහාසික සාධකයකි.

1. ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම්
2. ලෝවාමහාපායේ ගල් කැටයම්
3. ගඩලාදෙනි විහාරයේ ගල් කැටයම්
4. ගලපාත විහාරයේ කැටයම්
5. ලංකා තිලක විහාරයේ ඇති කැටයම් (........)

24. 'සිරි බර ඉඹුලේ තුරු රුස නිවෙසා' මෙහි ලඝු මාත්‍රා හා ගුරු මාත්‍රා සංඛ්‍යාව

1. ලඝු මාත්‍රා 10 ක් සහ ගුරු මාත්‍රා 04 කි.
2. ලඝු මාත්‍රා 10 ක් සහ ගුරු මාත්‍රා 02 කි.
3. ලඝු මාත්‍රා 12 ක් සහ ගුරු මාත්‍රා 02 කි.
4. ලඝු මාත්‍රා 14 ක් සහ ගුරු මාත්‍රා 01 කි.
5. ලඝු මාත්‍රා 12 ක් සහ ගරු මාත්‍රා 04 කි. (........)

25. දිවිදොස් පුවත පිළිබඳ සඳහන් සාහිත්‍ය කෘති දෙකක් වන්නේ,

1. කුවේණි අස්න හා පූජාවලිය.
2. සිහබා අස්න හා දළදා සිරිත
3. මහා වංශය හා දීප වංශය.
4. සිහබා අස්න හා පූජාවලිය.
5. කුවේණි අස්න හා සිහබා අස්න (........)

## ❖ 26-35 තෙක් හිස්තැන්වලට අදාල පිළිතුර යොදා හිස්තැන් පුරවන්න,

26. 'විභාවානුභාව ව්‍යභිචාරී සංයෝගාද් රස නිෂ්පත්තිඃ' මෙම රස සූත්‍රය ........................................... ග්‍රන්ථයෙහි ඇතුලත් වේ.

27. ගම්පොළ යුගයේ දේශාටන වාර්තාකරුවෙකු ලෙස .......................................... හැඳින්විය හැකිය.

28. ඉතාලිය, ප්‍රංශය, රුසියාව ......................................... නර්තනයේ ආරම්භය හා විකාශයට දායක වූ රටවල් ලෙස සැලකේ.

29. ප්‍රාග් බෞද්ධ යුගයේ දෙව් මිනිස් සහිත නැටුම් නැරඹීම සඳහා .................................................... රජු සහභාගී වූ බව ඓතිහාසික තොරතුරු වලින් හෙළිවේ.

30. විලම්භ ලය සමගුණ ලෙසද, ද්‍රැත ලය ...................................................... ලෙස ද හැඳින්වේ.

31. පින්නල් කෝලාට්ටම් යන ද්‍රවිඩ ගැමි නැටුම හා සමාන සිංහල ගැමි නැටුම ............................................... ලෙස ද හැඳින්වේ.

32. ආඝාත්මක හා අනාඝාතාත්මක ලක්ෂණ මිශ්‍ර වූ .............................................. තේරවිලි ස්වරූපයෙන් ද ගායනය කර ඇත.

33. උඩරට පා සරඹ හා සබරගමු ................................................ පාද හුරුකර ගැනීම සඳහා කරනු ලබන මූලික අභ්‍යාස වේ.

34. සංස්කෘතික දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ ................................................. වර්ෂයේ දීය.

35. පොළොන්නරු යුගයේ .................................................... ශිලා ලිපියෙන් දේවදාසි නර්තන පිළිබඳ තොරතුරු හෙලිවී ඇත.

## ❖ 36-50 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුරු තිත් ඉරමත ලියන්න.

36. 'ලෙලවන දිගුනෙත තිලුපුල සේයා' මෙම කවිය ඇතුලත් යුගය සහ සංදේශ කාව්‍ය නම් කරන්න.

1. යුගයඃ- ...............................................................
2. සංදේශ කාව්‍යඃ- ......................................................

37. කවි පදයක හෝ බෙර පදයක ඇති .......................................... හා ................................................. මාත්‍රා එකතුව සැදැස්මත් ලෙස හැඳින්වේ.

38. නාට්‍යය ශෛලීන් ............................................................... හා .................................................. වශයෙන් කොටස් දෙකකට බෙදේ.

39. 'මෙලෙසින් මල් මද දේවියේ' යන මෙම කවි පදය අයත් නර්තන අංගය හා නර්තන සම්ප්‍රදාය නම් කරන්න.

1. නර්තන අංගය ...................................................... 2. නර්තන සම්ප්‍රදාය ......................................................

40. නර්තන, ගායන, වාදන අවස්ථාවලදී පෙර තාල තැබීම ........................................................ ලෙසත් පසුතාල තැබීම ............................................................. ලෙසත් හැඳින්වේ.

41. 'නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදී.' ලෙස සඳහන් වන සෙල්ලිපිය හා එය අයත් යුගය සඳහන් කරන්න.

1. සෙල්ලිපිය :- .................................................... 2. යුගයඃ- ........................................................................

42. 1972 වර්ෂයේදී ආරම්භ කරන ලද ගුරු විදුහල හා 1936 වර්ෂයේ දී නර්තන විභාග සඳහා ආරම්භ කළ සභාව කුමක්ද?

1. ගුරු විදුහල :- ................................................................ 2. සභාව :- .................................................................

43. කාවඩි නර්තන සඳහා භාවිතා කරන අවනද්ධ භාණ්ඩය හා සුසිර භාණ්ඩය නම් කරන්න.

1. අවනද්ධ භාණ්ඩය ................................................... 2. සුසිර භාණ්ඩය ....................................................

44. පහත දැක්වෙන නාට්‍යමය පෙළපාලි අයත් වන නර්තන සම්ප්‍රදාය ලියන්න.

1. ගුරුගේ මාලාව ......................................................... 2. නානුමුරය .......................................................

45. හංසවිල හා ජීවන රිද්මය යන කලාකෘති අයත් සම්ප්‍රදායයන් දෙක කවරේද?

1. හංසවිල .......................................................... 2. ජීවන රිද්මය ........................................................

46. 'තෙල් ගාලා හිස පීරන් නෑනෝ ' මෙම කවි පදයට අයත් සදැස්මත් හා ගීමත් ගණන ලියන්න.

1. සදැස්මත් ගණන .................................................. 2. ගී මත් ගණන ..................................................

47. දඹදෙණි යුගයේදී ලලිත කලා හා සාහිත්‍ය කලා පිළිබඳ මනා දැනුමක් ලැබූ රජතුමා හා එතුමා විසින් රචනා කරන ලද ග්‍රන්ථය කුමක්ද?

1. රජතුමා ........................................................2. ග්‍රන්ථයේ නම ........................................................

48. 'කුන්දිරම්පල්ල' හා 'සවරම' දක්නට ලැබෙන වාදන භාණ්ඩ දෙක කවරේද?

1. කුන්දිරම් පල්ල .............................................................. 2. සවරම ..............................................................

49. මහනුවර යුගයේ කවිකාර මඩුවේදී ගායනය කරන ලද ප්‍රශස්ති බුද්ධ, ............................................................... හා ........................................... ප්‍රශස්ති ලෙස වර්ග කර ඇත.

50. තම දරුවන් මුහුදු වෙරළට වී සෙල්ලම් කරමින් සිටින අයුරු බලා සිටි නිමල්ගේ දෙනෙතින් කඳුළු සැලුනේ ජීවිත විශාල සංඛ්‍යාවක් බිලිගත් සුනාමි දිනය සිහිවීමෙනි. මෙහි භාවය හා රසය ලියන්න.

1.භාවය :- ............................................................. 2. රසය ..................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 12 - 2018**

විභාග අංකය .................................

# නර්තනය II පත්‍රය

කාලය පැය තුනයි

වැදගත්

I වන කොටසින් ප්‍රශ්න දෙකකට ද II, III, IV කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ. සෑම ප්‍රශ්නයකම I කොටසට ලකුණු (06) II කොටසකට ලකුණු (06) III කොටසට ලකුණු (08) ක් බැගින් හිමිවේ.

## I කොටස

01. i. 'කුදාංත ගත දොං' මෙම බෙර පදය අදාල තාල රූපයට ප්‍රස්තාර කරන්න.

ii. පහත සඳහන් කවිපද මාත්‍රා 3 + 4 දෙතිතේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

'යනෙන කලුගඟ එතෙර වැඩසිට රුපුන් යනමං බලව බලවා

දිලෙන රන්කඟ අතට අරගෙන විදුලියක් සේ ලෙලව ලෙලවා....'

iii. ගණපති වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

02. සිංහල ශාන්ති කර්ම සාරධර්ම, හා සමාජ සහජීවනය මෙන්ම විවිධ වූ නර්තන, ගායන, වාදන අංග වලින් ද පරිපූර්ණ ය.

i. කිරිමඩුව ශාන්ති කර්මයෙහි නර්තන, ගායන, වාදන අංග දෙක බැගින් නම් කරන්න.

ii. එම ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු හා කථා පුවත කෙටියෙන් ලියන්න.

iii. සමාජ සහජීවනය වර්ධනයෙහිලා කිරිමඩුව ශාන්ති කර්මය බලපාන ආකාරය ඇගයීමට ලක් කරන්න.

03. ශාන්ති කර්ම විධි ගත් කළ එකිනෙකට වෙනස් වූ අනන්‍ය ලක්ෂණ වලින් සමන්විත වේ.

i. වලියක් මංගල්‍යය හා කිරිමඩුව ශාන්ති කර්මයේ නාට්‍යමය අවස්ථා තුන බැගින් ලියන්න.

ii. කිරිමඩුව ශාන්ති කර්මයේ සැරසිලි හා අලංකරණ භාවිතයේ ඇති විශේෂතා පිළිබඳ විග්‍රහයක් කරන්න.

iii. වලියක් මංගල්‍යය හා කිරිමඩුව ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න.

## II කොටස

04. දේශීය නර්තන ඉතිහාසය අධ්‍යනය කිරීමේදී ලිඛිත මූලාශ්‍ර හා ඓතිහාසික සාධක වඩාත් වැදගත් වේ.

i. අනුරාධපුර යුගයෙහි නර්තන කලාව පැවැති තත්ත්වය පිළිබඳව මහා වංශයෙන් සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

ii. ගම්පොළ යුගයේ රූකම් ඇසුරෙන් හෙළිවන නර්තන කලා තොරතුරු සැකෙවින් විස්තර කරන්න.

iii. ක්‍රි.ව. 1970 න් පසු දේශීය නර්තන කලාවේ අධ්‍යාපනික වශයෙන් ඇති වූ වෙනස්කම් පිළිබඳ විමසීමක් කරන්න.

05. සිංහල හා ද්‍රවිඩ ජනතාවගේ ජීවන රටාව ගැමි නැටුම් තුලින් පිළිඹිබු වේ.

i. සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් නම් කර ඉන් එක් ද්‍රවිඩ ගැමි නැටුමක් පිළිබඳ විස්තර කරන්න.

ii. සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් තුලින් පිළිඹිබු වන ආගමික පසුබිම පිළිබඳ විමසුමක් කරන්න.

iii. එම ගැමි නැටුම් වල දක්නට ලැබෙන සාමානතා හා අසමානතා පිළිබඳ විග්‍රහයක් කරන්න.

## III කොටස

06.

| (අ) | (ආ) | (ඉ) |
|---|---|---|
| මනමේ | සොකරි | හංසවිල |
| සිංහබාහු | පරයා | නට්ක්‍රැකර් |
| කැළණිපාලම | නොංචි | ජීවනයේ රිද්මය |
| මෝදර මෝල | මුදලි | කල්පනා |

i. 'අ' කොටසෙහි සඳහන් නාට්‍ය ලෝක ධර්මී සහ නාට්‍ය ධර්මී ලෙස වෙන් කර එම ශෛලීන් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

ii. 'ආ' කොටසෙහි සඳහන් ගැමි නාටකවල නර්තනය භාවිතා කර ඇති ආකාරය එක් චරිතයක් ඇසුරින් විස්තර කරන්න.

iii. 'ඉ' කොටසෙහි සඳහන් බටහිර බැලේ සහ නෘත්‍ය නාටකවල නර්තනය යොදාගෙන ඇති ආකාරයේ ඇති වෙනස්කම් විස්තර කරන්න.

07. i. නව නළු රසය හා ඒ හා සම්බන්ධ භාවයන් නම් කරන්න.

ii. රස නිෂ්පත්තිය සිදුවන ආකාරය භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රය ඇසුරෙන් විමසන්න.

iii. දේශීය නර්තන සම්ප්‍රදායවල රස නිෂ්පත්තිය දැකිය හැකි අවස්ථා ශාන්ති කර්මයක් ඇසුරෙන් විස්තර කරන්න.

## IV කොටස

08. i. උඩරට, පහතරට, සබරගමු, සම්ප්‍රදායයන් වලට ආවේණික ප්‍රධාන ඇඳුම් කට්ටල් වලට අයත් ආභරණ දෙක බැගින් නම් කරන්න.

ii. දේශීය සාම්ප්‍රාදායික නර්තන අංග සඳහා සුදුසු රංග ආභරණ නිර්මාණය කිරීමේදී භාවිතා කළ හැකි අමුද්‍රව්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii. රංග ආභරණ පිළිබඳ පන්ති කාමරයේ දී කරන ලද ක්‍රියාකාරකමට අදාලව ඔබ තෝරාගත් රංග ආභරණයක දළ රූප සටහනක් ඇඳ එය නිර්මාණය කිරීමේ ක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. i. නර්තන අධ්‍යාපනයෙන් සිදුවන මානසික සංවර්ධනය ඉවසීම ප්‍රගුණ කිරීමෙහිලා වැදගත් වේ. විමසන්න.

ii. රසඥතාව වර්ධනය සඳහා පෙරහැර සංස්කෘතිය හා බැඳි නර්තනාංග ඉවහල් කරගත හැකි ආකාරය විමසන්න.

iii. නර්තන කලාවේ පැවැත්ම සහ ප්‍රවර්ධනය සඳහා නර්තන අධ්‍යාපනයේ ඇති වැදගත්කම අගයන්න.

**12 ශ්‍රේණිය** **නර්තනය I** **පිළිතුරු පත්‍රය**

## I කොටස

1. 4
2. 5
3. 2
4. 3
5. 5
6. 2
7. 3
8. 2
9. 1
10. 3
11. 2
12. 1
13. 2
14. 3
15. 1
16. 2
17. 3
18. 1
19. 3
20. 1
21. 3
22. 4
23. 1
24. 3
25. 5
26. නාට්‍ය ශාස්ත්‍රය
27. ඉබන් බතුතා
28. බැලේ
29. පණ්ඩුකාභය
30. සිව්ගුණ
31. ලී මල්ලිය
32. ටීකා සිව් පද
33. මණ්ඩි පද
34. 1956
35. පාලමොට්ටායි
36. යුගය - කෝට්ටේ සංදේශය - පරෙවි
37. 1. ලඝු 2. ගුරු
38. ලොක් ධර්මී, නාට්‍ය ධර්මී
39. 1. නර්තන අංගය - ශුද්ධ මාත්‍රය 2. සම්ප්‍රදාය - පහතරට
40. 1. අවග්‍රහ 2. විෂමග්‍රහ
41. 1. සෙල්ලිපිය - කොරවක්ගල 2. යුගය අනුරාධපුර යුගය
42. 1. හිරාගම ගුරු විද්‍යාල 2. ගාන්ධර්ව සභාව
43. 1. තවිල් බෙරය 2. නාදස්වර්ම් (නාගස්වරම්)
44. 1. ගුරුගේ මාලාව - උඩරට 2. නානුමුරය - පහතරට
45. 1. බැලේ 2. භාරතීය නෘත්‍ය නාටක
46. සදැස්මත් - 16 ගීමත් 32
47. දෙවන පරාක්‍රමබාහු 2. කව් සිළුමිණ
48. 1. කුන්දිරම්පල්ල - තම්මැට්ටම 2. සවරම - උඩැක්කිය
49. 1. රාජ ප්‍රශස්ති 2. දේව ප්‍රශස්ති
50. 1.භාවය - ශෝක 2. රසය- කරුණා

## II පත්‍රය - I කොටස

01 i.

| 1̂ 2 | 1̂ 2 | 1́ 2 3 4 | 1̂ 2 | 1̂ 2 | 1́ 2 3 4 |
|---|---|---|---|---|---|
| + + | + + | කු ඳිං - ත | ග ත | දොං - | කු ඳිං - ත |
| ග ත | දොං - | | | | |

සංකේත භාවිතයට ල. 02
නිවැරදිව ප්‍රස්තාර කිරීම ල. 04 (මුළු ල. 06)

ii.

| 1̂ 2 3 | 1́ 2 3 4 | 1̂ 2 3 | 1́ 2 3 4 |
|---|---|---|---|
| ය නෙ න | ත ළු ග ග | ජ තෙ ර | වැ ඩ සි ට |
| රැ ඳුන් - | ය න මුං - | බ ල ව | බ ල වා - |
| දි ලෙ න | රැස් - ත ග | අ ත ට | අ ර ගෙ න |
| වි දු ලි | යක් - සේ - | ලෙ ල ව | ලෙ ල වා - |

සංකේත භාවිතයට ල. 02
නිවැරදිව ප්‍රස්තාර කිරීම ල. 04 (මුළු ල. 06)

iii.

| 1' | 2 | 3 | 1' | 2 | 3 | 1' | 2 | 3 | 1' | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාත් | - | - | ත | ක | ට | තරි | කිට | දොද් | දොම් | - | - |
| තරි | කිට | දොද් | දොම් | ගත් | තත් | තරි | කිට | දොද් | දොම් | - | - |
| ගත් | - | ත | කු | ත | ක | ජිත් | - | ත | කු | ත | ක |
| තරි | කිට | දොද් | දොම් | ගත් | තත් | තරි | කිට | දොද් | දොම් | + | + |

සංකේත භාවිතයට ල. 02

නිවැරදි ප්‍රස්තාර කිරීම ල. 06 මුළු ල. 08

(මුළු ල. 20)

02\. i. කිරිමඩුව ශාන්ති කර්මය

නර්තන අංග :- හත්පද පෙළපාලිය, යහන් දැක්ම, පන්දම් පද, සමයන් පද නැටීම, මල් පද නැටීම............ ආදී

ගායන අංග :- නුගේහැල්ල, පත්තිනි හැල්ල, දේවකන්නලව්ව.... ආදී

වාදන අවස්ථා :- මංගල දවුල් වාදනය, හේවිසි වාදන, නර්තන අංග සඳහා වාදන යනාදී. (ල. 2 x 3 = 06)

ii. ගව පට්ටි ආරක්ෂා කර ගැනීමට

භව භෝග සශ්‍රීකත්වය උදෙසා ........... ආදී මෙහි ප්‍රධාන අරමුණු බව ලියා තිබීම. (ල. 02)

මායා රටෙහි රජුගේ වර්ණ නම් අග මෙහෙසිය දරුවන් නැති සොවින් ............ යන කථා පුවත ලියා තිබීම.

(ලකුණු 04 මුළු ලකුණු 06)

iii. ශාන්ති කර්මය ආරම්භය හා සබැඳි චාරිත්‍ර වාරිත්‍ර ඇසුරෙන් සහජීවනය වර්ධනය වන බව ලියා තිබීම.

එකමුතුකම, සමානාත්මතාවය, ආගන්තුක සත්කාර විශ්වාස හා සාරධර්ම තුලින් සහජීවනය වර්ධනය වන බව උදාහරණ සහිතව විස්තර කිරීම. (ල. 08) (මුළු ලකුණු 20)

03.i. වළියක් මංගලාය, වැදියක්කම, නයා යක්කම, කීල බැඳීම, කාලි යැම, ගුරුගේ මාලාව

කිරිමඩුව, ඇත් බන්ධනය, මී බන්ධනය. ආඩිගුරු නැටීම

නාට්‍යමය අවස්ථා තුන බැගින් ලියා තිබීම. 3 x 2 = 06

ii. පත්තිනි තොරණ සකස් කිරීම.

මල් යහන් සකස් කිරීම.

කිරිමඩු මණ්ඩපය හා මැස්ස සකස් කිරීම.

මැස්ස සකස් කිරීමේදී ඒ මත පස් දමා උස් වූ වේදිකාවක් ලෙස සකස් කර ඒ වටා ගොක් රැහැන් ඇදීම ආදී කරුණු තුලින් විස්තර කිරීම.

iii. වළියකුම ශාන්තිකර්මය මාළිගාවේ දවල් පෙරහැර අවසන් කර දිය කපා පසුදින රාත්‍රියේ පටන් නොකඩවා සත් දිනක් තුළ පැවැත්වෙන පූජා පිළිවෙල විස්තර කිරීම.

මහනුවර දළදා පෙරහැරේ දිය කැපීමේ පෙරහැර අවසන් කිරීමෙන් පසු පෙරහැරට ආධාර උපකාර කළ පිරිස, දායක වූ නිළමෙවරුන් ඇතුළු නිළධාරීන් හා පෙරහැරේ ගමන් ගත් අලි ඇතුන්ටත් සහභාගී වීමෙන් ඇති වූ වස් දොස් දුරු කිරීමේ අරමුණින් මෙය පවත්වන බව.

කිරි මඩුව ශාන්ති කර්මය

තුණුරුවන් හා මංගර දෙවියන්, විෂ්ණු, සමන්, කතරගම, දැඩිමුණ්ඩ, ආදී දෙවිවරුන් උදෙසා පහන් දැල්වීම.

වී කෙටීම, මුරුතැන් පිසීම.

මංගර දෙවි යාදින්න.

| | |
|---|---|
| දොළහදෙවි උපත | පත්තිනි දෙවියන්ට පහන් දැල්වීම. |
| හත්පද පෙළපාලිය | කිරි ඉතිර වීම. |
| පඬුරු ඔප්පු දීම. | දේව යාතිකාව හා සෙත් පැතීම. |
| මුරුතැන් පිදීම. | කිරි ඉසීම |

යනාදී චාරිත්‍ර ඇසුරෙන් ඉහත කියමන සනාථ කර ඇත්නම් (ල. 08) (මුළු ල. 20)

04\. i. මහා වංශයේ සාධක

දුටුගැමුණු රජු රුවන්වැලිසෑයේ ධාතු නිධන් කිරීමේ උත්සවයට නළඟනන් පිරිවරාගෙන ගිය බව.

රජු මහා සෑයේ ධාතු නිධාන උත්සවයේදී පූජා කළ වස්තු අතර නිළියන්ද වූ බව.

භාතිකාභය රජු සමයෙහි ජයමහා බෝධිය, බෝධි ස්නාන පූජාය....... සුතසු දහසක් පූජාය.... යන අවස්ථා සඳහා නානාප්‍රකාර පසඟතුරු ගොස පැවැත්වූ බව.

ආදී සාධක 02 ක් ලියා ඇත්නම් (ල. 06)

ii. ගම්පල යුගයේ රූකම්.

- ලී කැටයම් - ඇම්බැක්කේ දේවාලයේ උළුවස්සට වම් පසින් ඉහළ ඇති බාල්කයෙහි ලී කෙළින නාරි රූප වලින් විදහා පාන නර්තන විලාස (ඉරියව්වල තාත්ත්වික බව, කලාත්මක බව, පැළඳි ආභරණ)
- එහිම ලී කණුවල ඇති සිව්රැස් පනේලයක නළඟන රුවක් දක්නට ලැබේ. (එම නර්තන විලාශය දකුණු ඉන්දීය ලක්ෂණ පෙන්නුම් කරයි.)

- IV වන බුවනෙකබා රජ සමයේදී ඉදිකරන ලද ගඩලාදෙණිය විහාරයේ පාදමේ දැක්වෙන රූකම් නටන වයන රූකම් අතර නළාව, උඩැක්කිය, රබාන, තාලම්පට. දක්නට ලැබේ. (නර්තනය හා වාද්‍ය භාණ්ඩ අතර සබඳතාමය, නර්තන කලාවේ දියුණුව පෙන්නුම් කරන බව.)
- බෙන්තොට අසල ගලපාත, ගලතුරු මුල රජමහා විහාරයේ ගල් උළුවස්සෙහි කැටයම් කර ඇති බෙරවාදන රූප, හොරණෑ පිඹින රූප හා නාට්‍යාංගනාවන්ගේ රූප ඉහත සාධක තුළින් නර්තන විලාශ විස්තර කිරීම. (ල. 06)

iii. 1972 ගිරාගම සෞන්දර්ය ගුරු විදුහල ආරම්භ කිරීම තුළින් නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම.
1972 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා සෞන්දර්ය විෂය අනිවාර්ය වීම.
1978 වර්ෂයේදී අ.පො.ස.(උ.පෙළ) විෂය ධාරාවට සෞන්දර්ය විෂය ඇතුලත් වීම.
යනාදී අධ්‍යාපනික වශයෙන් එක් වූ කරුණු තුළින් පිළිතුර ලියා ඇත්නම් (ල. 08)

05. i. සිංහල ගැමි නැටුම් වර්ගඃ- ලී, කළ, ගොයම්, කුළු, මෝල්ගස්, පතුරු, තාලම් ආදිය
ද්‍රවිඩ ගැමි නැටුම් වර්ගඃ- කෝලාට්ටම්, චෙම්බු (සෙම්බු) අරව්වෙට්ටු, සුළකු, කරගම්, කාවඩි, කොළඳු පරිතාල්, උලවර නඩනම් ..... යනාදි
එක් ද්‍රවිඩ ගැමි නැටුමක් අදාල කරුණු සහිතව විස්තර කර ඇති බව.
ගැමි නැටුම් 03 බැගින් ලියා තිබීමට ල. 03
ද්‍රවිඩ ගැමි නැටුම විස්තර කිරීමට ල. 03 (මුළු ල. 06)

ii. ගැමි නැටුම් යනු ග්‍රාමීය ජනතාව විසින් විඩාව, කාංසිය, තෙහෙට්ටුව, හුදකලාව, ඒකකාරී බව හා විනෝදාස්වාදය උදෙසා නිර්මාණය කරගත් නර්තන විශේෂයක් බව.
ගැමියාගේ ජීවන වෘත්තීන්, සමාජ අවශ්‍යතා, සිරිත් විරිත් විශ්වාස, යනාදිය කැටි කොටගත් නැටුම් විශේෂයක් බව.
ගැමි සමාජය බුදු දහම මහත් භක්තියෙන් පිළිපදින බව.
බෞද්ධ ගැමි ආගමික ලක්ෂණ ගැමි නැටුම තුළ අන්තර්ගත වී ඇති බව.
සොබාදහමේ වස්තූන් දේවත්වයෙන් පුදන ලද බව.
ගැමි නැටුම් සඳහා යොදාගත් ගායනාවන් මගින් බුදු හිමියන්, දෙවි දේවතාවුන්, ඉර, හඳ මිහකත් දෙවිඳුන්ගෙන් අවසර ගැනීම තුලින් ආගමික පසුබිම නිරූපණය වන බව.
ආගමික පසුබිම ගායනා තුළින් හෙළිවන බව.

- සතර වරම් දෙවි සතර දෙනාටයි.
- වැඳ වැඳ පිං දෙමි අවසර ගන්ටයි.
- බෝ පත්තිනි මට අවසර දෙන්නේ
- වැඳ ගත්තෙමි නාරායන සරණා
- අඩිය තබන්නට මිහිකත් අවසර
- සරණයි සරණයි බුද්ධං සරණයි

මෙම ගායනා තුලින් ආගමික පසුබිම තීව්‍ර කරන බව ලියා තිබීම.
ද්‍රවිඩ ගැමි නැටුම් ද ආගමික පසුබිම මත නිර්මාණය වී ඇති බව. (දකුණු ඉන්දියානු ආගමික පසුබිම)
උදා:- කෝලාට්ටම්, චෙම්බු
ඉන්දියානු ද්‍රවිඩ ආගමික පසුබිම මත නිර්මාණය වීම.
කාවඩි නැටුමද කතරගම දෙවියන්ට මෙන්ම මුරුගන් දෙවියන්ට ගෞරව පිණිස පවත්වන බව යනාදී කරුණු ලිවීමට (ල. 06)

iii. **සමානතා**
සිංහල ගැමි නැටුම් වලට සමාන ද්‍රවිඩ ගැමි නැටුම් නාමික වශයෙන් සමානතා දක්වයි.

| **සිංහල** | **දෙමළ** |
|---|---|
| කලගෙඩි | සෙම්බු |
| ලී කෙළි | කෝලාට්ටම් |
| ලී මල්ලිය | පින්නල් කෝලාට්ටම් |
| ගොයම් නැටුම | අරිව්වෙට්ටු |
| කුළු නැටුම | සුළකු |

- සාමුහික බව, උපකරණ භාවිතය
- සරල අංග චලන භාවිතය
- ගායන වාදන නර්තන අන්තර්ගතය
- සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වලදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම සහභාගී වන බව.

**අසමානතා**

- කාවඩි, කුම්මි නැටුම් සඳහා සමාන ගැමි නැටුම් සිංහල ගැමි නැටුම් වල දක්නට නොලැබෙන බව.
- කරගම් (කරහම්) කොහොඹ කළේ නැටුම් ද්‍රවිඩ ගැමි නැටුම් වල පමණක් දක්නට ඇති බව.
- සිංහල ගැමි නැටුම් බෞද්ධාගමික සංස්කෘතිය මත ගොඩ නැගී ඇති අතර ද්‍රවිඩ ගැමි නැටුම් දකුණු ඉන්දියානු සංස්කෘතිය මත ගොඩනැගී ඇති බව.
- රංග වස්ත්‍රාභරණ වල වෙනස්කම් දක්නට ලැබෙන බව උදා:- සිංහල කාන්තාව රෙදි හැට්ටවලින් සැරසෙන අතර, දෙමළ ලඳුන් සාරියෙන් හෝ වළලු කර දක්වා දිග සායකින් හා හැට්ටයකින් සැරසෙමින් නර්තන ඉදිරිපත් කරන බව
- ගායනයේ හා වාදනයේ වෙනස්කම් දක්නට ඇති බව
- සිංහල ගැමි නැටුම් සඳහා සාම්ප්‍රදායික මෙන්ම විකල්ප වාද්‍ය භාණ්ඩ යොදා ගන්නා බව
  උදා:- ගැටබෙරය, දවුල, තම්මැට්ටම, චල් වළල්ල, දෙවොල් බෙරය, තාලම්පට
- ද්‍රවිඩ ගැමි නැටුම සඳහා ද්‍රවිඩ සංස්කෘතියට ආවේණික වාදන භාණ්ඩ යොදාගන්නා බව

- උදා:- තවිල් බෙරය, නාගස්වරම් (නාදස්වර්ම) මද්දලය, නටුවාංගම් යනාදිය.
- සිංහල ගැමි නැටුම් සඳහා සරල, ගායනය, වාදනය. චලන සජීවිව යොදාගන්නා අතර
- ද්‍රවිඩ ගැමි නැටුම් වල එන කාවඩි, කරගම්, කොහොඹකලේ පසුබිම් සංගීතයට අනුව දුෂ්කර ඉරියව් භාවිතා කරමින් සමබරතාවය රැකෙන පරිදි රංගනයේ යෙදෙන බව. (ල. 08) මුළු ල. 20

06. i. ලෝක ධර්මී නාට්‍ය
කැළණි පාලම, මෝදර මෝල — නාට්‍ය ධර්මී නාට්‍ය
මනමේ, සිංහබාහු වෙන් කිරීම (ල. 02)

- ලෝක ධර්මී නාට්‍යඃ-
  - මෙම නාට්‍ය ස්වභාවික නාටය සම්ප්‍රදාය ලෙස ද හැඳින්වෙන බව
  - ලෝකයේ පවතින තත්ත්වය ඒ අයුරින්ම අනුකරණය කිරීම ලෝකධර්මී නාට්‍ය වන බව
  - 19 වන සියවස අගභාගයේ ප්‍රචලිත වූ බව
  - යුරෝපයේ ජන්මය ලත් මෙම නාට්‍ය අද ආසියාතික රටවල පවා පැතිර පවතින බව
  - එදිනෙදා ජීවිතයේ හැසිරෙන ආකාරයට සමීපව හැසිරීම, භාෂාව, වස්ත්‍රාභරණ, අංග රචනය යොදා ගැනීම අදිය ලෝක ධර්මී නාට්‍ය තුළ සිදුවන බව.
  - සංගීතය ආදියෙන් ද තත්වානුකූල බව ප්‍රකාශ කෙරෙන බව.
  - නිරූපනය කරන චරිතයේ සැබෑ ස්වරූපය පෙනෙන ලෙස නළුවා හැඩ ගැන්වෙන බව.
  - උදා:- (වයස අනුව මුහුණ සහ හිස, රැවුල, හැඩ ගැන්වීම)
  - මෙහිදී භාවිතා කරන උපකරණ ස්වභාවික වන බව උදා:- නිදන කාමරයක් නම් ඇඳ, පුටු, මේස, යනාදි
  - ලෝක ධර්මී නාට්‍ය සම්ප්‍රදායට අනුව නිර්මාණයට වූ හොඳම නිදසුන ආර්.ආර්. සමරකෝන්ගේ 'කැළණි පාලම' බව යනාදී කරුණු ලියා ඇත්නම් (කරුණු 04 ල. 02)
- නාට්‍ය ධර්මී නාට්‍ය
  - ලෝකයේ පැවැත්ම වෙනස් ආකාරයෙන් ඉදිරිපත් කිරීම නාට්‍ය ධර්මී නාට්‍ය බව.
  - මෙම නාට්‍ය ශෛලියට නාට්‍ය කිරීමේදී නර්තනය බහුලව යොදා ගනිමින් සංගීතය ද භාවිතා කරන බව.
  - තවද, සංවාද. රංගන සමඟ ගීත ද, රිද්මයන් අනුව යොදා ගනිමින් අභිනයන් සංකේතානුරූපීව නිරූපණය කිරීමත් වෙස් මෝස්තර ගමන්තාල රංග භාණ්ඩ ආදිය එයට ගැලපෙන ආකාරයට යොදා ගැනීම මෙහි මූලික ලක්ෂණය බව.
  - ස්වභාවිකත්වයෙන් ඈත්වූ එක්තරා ශෛලියකට නාටය සෑම අංගයක්ම ඉදිරිපත් කරන නිසා ශෛලිගත ක්‍රමය (ශෛලිගත නාට්‍ය) යනුවෙන් ද හඳුන්වන බව.
  - මෙහිදී දක්නට ලැබෙන්නේ ස්වභාවිකත්වය ඉක්මවා ගිය අතිශයෝක්තියකි.
  - මෙම නාට්‍ය සඳහ හොඳම උදාහරණයක් ලෙස මහාචාර්‍ය එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍ය හැඳින්විය හැකි බව. ආදී කරුණු ලියා ඇත්නම්
  ල. 02 I කොටස සඳහා ලකුණු 06) (කරුණු 04 ල. 02)

ii. අ කොටස

- **සොකරි**
  - සොකරි ගැමි නාටකය තුළ රඟ දැක්වෙන ප්‍රධානම කාන්තා චරිතය වන මැය ඉතා රූමත් තරුණියක් බව.
  - සොකරිය, කලාත්මක, ලයාන්විත, ශෘංගාරාත්මක රසයක් මතුවන ආකාරයෙන් බෙර පද හා ගායනයන්ට අනුව අංග චලන දක්වමින් ගමනේ යෙදෙන බව.
  - දොං ජිජිගත බෙර පදයට අනුව ඇය රංගනයේ යෙදෙන බව.
  - සොකරී එන්නී සබයෙන් අවසර ගන්නී............ යනාදී කවියක් ලියා එම කවි වල අදහස පිළිඹිඹු වන අයුරින් සොකරිගේ චරිතයට නර්තනයට යොදාගන්නා බව පැහැදිලි කිරීම..... යනාදී අදාල කරුණු ලියා තිබීම.
- **පරයා**
  - සොකරි සහ ආඩිගුරුගේ අතවැසියා පරයා බව
  - ඔහු මුඛරි බසින් යුක්ත බව
  - මෙම නාටකයේදී ගුරුහාමි හා ප්‍රේක්ෂකයා සම්බන්ධ කරන අතරමැදි චරිතය බව.
  - බෙරපදයට සහ ගායනයට අනුව වටේට නටමින් ප්‍රේක්ෂකයාට හාස්‍ය රසයක් ලබා දෙන බව
  - විකට ස්වරූපයකින් යුක්ත චරිතයක් බව හා ඒ සඳහා ගැලපෙන සරල නර්තනයන් යොදා ගන්නා බව
  - සොකරිය දෙස ගිජු බැලුම් හෙලන අතර පරයාගේ නැටුම් පිළිවෙලකට නොකෙරෙන බව
  - බෙර තාලයට අනුව උඩ පනිමින් අතපය විසි කරමින් හාස්‍යෝත්පාදනය වන අයුරින් චරිතය නිරූපනය කරන බව.
  - ඒ බව සනාථ කිරීමට කවියක් ලියා ඇති බව.
  උදා:- ඉතිං කියන්නේ තුන්වෙනි ආදී කරුණු ලියා තිබීම.
- **නොංචි**
  - ගායනය, සංවාද, සහ නර්තනය යොදාගෙන නොංචිගේ චරිතය මහළු චරිතයක් ලෙසින් නිරූපණය කරන බව.
  - එම චරිතය ප්‍රාණවත් චරිතයක් ලෙස ඉදිරිපත් කරන බව

- මෙම චරිතයේ ස්වභාවය සමඟ එයට යෙදෙන රංගනයක් ඒ සඳහා යොදාගෙන ඇති වෙස් මුහුණත් තුළින් චරිතයේ ස්වරූපය ඉස්මතු කර පෙන්වන බව.
- නොංචිගේ ගමන සඳහා යොදා ගන්නා බෙර පදය ලියා ඇති බව.
  (දොංත ගතම් දොංත ගදිගතම් තත් රෙගතම් තත් රෙගති ගතම්)
- මෙම පදයට ප්‍රථමයෙන් විලම්භ ලයට නර්තනය කිරීම හා ඉන්පසු වේගය වැඩිකර නර්තනයේ යෙදෙන බව.
- ගමනේ යෙදෙමින් කවරෙකු හෝ සොයන බව විවිධ චලන භාවිතයෙන් පෙන්වන බව.
- ශරීරය ඉදිරියට නමා ගනිමින් ගමනේ යෙදෙන බව
- බෙර පදයේ තාලයට උකුල කරකවන බව හා රෙද්ද සහ හැට්ටය සකස් කරමින් ගමනේ යෙදෙන බව ........ යනාදි කරුනු ලියා තිබීම.

මුදලි

- මුදලි කෝලම සඳහා මුදලිගේ චරිතයට යොදාගෙන ඇති බෙර පදය එකී චරිත නිරූපණය සඳහා මනාව ගැලපෙන බව
  (ගත ගුම් රිම්ගත ගදිගත ගදිත ගතම් ගත්තම් ගදිත ගතම් තකු දොං ගුද ගුදිතකු දොම්) බෙර පදය ලියා තිබීම.
  එම බෙර පදයට අනුව මුදලි මහේශාඛ්‍ය ලීලාවෙන් ගමන් කරන බව.
  චරිතයේ ගැඹුරු බව පෙන්වීමට හා චරිතයට අදාළ ආකාරයට චලන නිර්මාණය කරමින් බෙර පදයට අනුව ගමන් කරන බව
  මෙම චරිත වලින් එකක නර්තනය භාවිතා කර ඇති ආකාරය ලියා ඇත්නම් (ල. 06)
  01. සොකරි 02. පරයා 03. නොංචි 04. මුදලි

iii.

| බැලේ නාට්‍ය | භාරතීය නෘත්‍ය නාටක |
|---|---|
| • ඉතාලියෙන් ආරම්භ වූ බැලේ නාටය එකල පැවති සමාජමය නැටුම් පදනම් කරගෙන ආරම්භ වූ බව<br>• රිද්මයානුකූල චලන බහුලව භාවිතා කිරීම.<br>බැලේ නර්තනය සඳහා ආංගික ආහාර්ය අභිනය ප්‍රබල වීම.<br>• පැනීම්, කැරකීම් සහ ඇගිලි තුඩු වලින් කරන ක්‍රියාකාරකම් දක්නට තිබීම.<br>• ලිස්සා යෑම, පාවීම වැනි ක්‍රියාකාරකම් තිබීම.<br>• නිශ්චිත රංග රේඛා මත නර්තනය පිහිටුවීම.<br>• විචිත්‍ර රේඛා සහ රූප රාමු ගොඩ නැගෙන ආකාරයට නර්තනය යොදා ගැනීම. | • භාරතීය නෘත්‍ය නාටක (Dance Drama) ගොඩනැගී ඇත්තේ භාරතයේ පැරණි ග්‍රාම නාටක ඇසුරින් බව.<br>•තාලානුකූල හා ප්‍රකාශනාත්මක චලන වැඩි වශයෙන් භාවිතා කිරීම.<br>• මහා භාරතය, රමායනය ........... ආදී ග්‍රන්ථ ඇසුරෙන් කතා රඟ දැක්වීම.<br>• භරත, කථක්, කථකලි, මනිපුරි නර්තන සම්ප්‍රදායන්වල තාල, භාව, මුද්‍රා චලන හා අනෙකුත් ආනුශාංගික අංග ඇසුරෙන් නර්තන නිර්මාණය වී ඇති බව<br>• සාත්වික හා ආහාර්ය අභිනය සුවිශේෂි බව<br>• නෘත, නෘත්‍ය නාට්‍ය ලක්ෂණ අන්තර්ගත වීම. |

ය

යනාදී කරුණු යොදා පිළිතුරු ලිවීමට (ල. 08)

07. i.

| රසය | භාවය |
|---|---|
| ශෘංගාර | රති |
| හාස්‍යය | හාස |
| කරුණා | ශෝක |
| රෞද්‍ර | ක්‍රෝධ |
| වීර | උත්සාහ |
| භයානක | භය |
| බීභත්ස්‍ය | ජුගුප්සා |
| අද්භූත | විස්මය |
| ශාන්ත | ශාන්ත |

(ල. 06)

ii. 'විභාවානුභාව ව්‍යභිචාරී සංයෝගාද්' ............ වශයෙන් භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ දක්වා ඇති බව.
විභාව, අනුභාව, ව්‍යභිචාරිභාව සංයෝග වී රස නිෂ්පන්න
විභාව - පුද්ගල චිත්ත සන්තානයෙහි ඇති ස්ථායි භාව අවදි කරවීමට මුල්වන බව එය ආලම්භන විභාව හා උද්දීපන විභාව වශයෙන් කොටස් 02 ක් වන බව.
අනුභාව - නාට්‍යක නර්තනාංගයක, චලන, ඉරියව්
රංග වස්ත්‍රාභරණ, වචන වැනි විලාශ තුලින් දක්වන හැඟීම් ප්‍රකාශනයයි. එමඟින් රස විඳීම සිදු කිරීම.
සිනහව, මුහුණ රතුවීම, කඳුළු සැලීම, වැනි දේ මගින් චරිතයේ මනෝභාව ප්‍රකට කිරීම.
ව්‍යභිචාරීභාව - ප්‍රධාන භාව වලට දෙවෙනි වූ උපභාවයකි.
ස්ථිරව නොපවතී.
වෙනස්වන සුළුය.

ඇතිවෙමින් නැතිවෙමින් පවතී.
උදා:- විශ්මය නැමැති ස්ථායි භාවය පවතිද්දීම පුදුමයත්, සැකයත් වැනි උපභාවයන් ඇතිවී නැතිවී යාම.

ඉහත භාව සම්මිශ්‍රණයෙන්, දක්වන භාවයන් මිනිස් චිත්ත සන්තානයේ ඇති ස්ථායි භාව සමග සම්මිශ්‍රණය වීමෙන් රස නිෂ්පත්තිය වන බව. (ල. 06)

iii. සන්නියකුමේ - යක් නැටුම්, පාලි නැටුම්, මරු සන්නිය, සන්නි 18
දොවොල් මඩුව, පහන් මඩුවේ - දොවොල් ගොඩ බැසීම, අඹ විදමන
රට යකුම - දොළහ පෙළපාලිය
සූනියම - වඩිගපටුන
ඉහත නර්තන අවස්ථා තුළ පවතින සිද්ධි ඇසුරින් භාව, රස විස්තර කර ඇත්නම් (ල. 08) (මුළු ල.20)

08. i. උඩරට - වෙස් ඇඳුම් කට්ටලය
අවුල් හැරය. බන්දි වළලු, පබළු කරපටිය, රිදී කඩුක්කන්, සිලම්බු
පහතරට - කාගුල් තොප්පිය, කාගුල්, සිලම්බු, ගෙජ්ජි
සබරගමු - කඩුක්කන්, නෙත්තිමාලය, කර පටිය, රහු කුට්ටම (ල. 06)

ii. ඇට වර්ග, කාඩ්බෝඩ්, ලී කුඩු පල්ප්, විවිධ මහතින් යුතු අඹරන ලද කපු පුළුන්, නිෂ්පාදිත කෘතිම රබර් විශේෂ, කම්බි තීන්ත වර්ග, රන්, රිදී, තඹ ආදී වර්ණ වලින් යුතු කුඩු හා ගම් විශේෂ යනාදී ලියා තිබීම. (ල.06)

iii. රංග ආභරණයක දළ රූප සටහනක් ඇඳ එය නිර්මාණය කිරීමේ ක්‍රම පිළිබඳ විග්‍රහයක් කර තිබීම.
රූප සටහන ඇඳීමට (ල. 03)
විස්තර කිරීමට (ල. 05) (මුළු ලකුණු 08) (මුළු ල. 20)

09. i. නර්තන හා සම්බන්ධ ආචාරධර්ම
නර්තන අභ්‍යාස වල යෙදීම
ලය පවත්වා ගැනීම.
වාදනය හා ගායනය අනුව නර්තයේ යෙදීමෙන් ඉවසීම ප්‍රගුණ කිරීම.
යහපත් ආකල්ප වර්ධනය
තරග ජය පරාජය විඳ ගැනීම.
නර්තන අංග නිර්මාණය කිරීම...... ආදී කරුණු තුළින් විස්තර කර තිබීම. (ල.06)

ii. පෙරහැර සංස්කෘතිය හා සම්බන්ධ නර්තනාංග රසඥතාවය වර්ධනයට ඉවහල් වන බව.
පෙරහැරෙහි නර්තනාංග විවිධාකාර වීම නිසා රසඥතාවයට මනා පිටුබලයක් ලැබෙන බව.
ඒ සඳහා ඉදිරිපත් කරන නර්තන අංග විවිධ සම්ප්‍රදායන් වලින් යුතු වීම සහ ඒවා එකවර නැරඹීමට හැකිවීම තුළින් රසඥතාවය වර්ධනය වන බව.
පෙරහැරෙහි දක්නට ලැබෙන නැටුම් වර්ග ලියා තිබීම.
නැටුම සඳහා යොදාගන්නා ඇඳුම් පැළඳුම් රංගාභරණ, වෙස් ගැන්වීම..... දක්නට ලැබීම් තුළින් රසඥතාවය වර්ධනය වන බව.
ආලෝකයද පෙරහැර භාවිතයේ දී ඇතැම් ශිල්පීන් දක්ෂ ලෙස භාවිතා කිරීම..... යනාදී කරුණු තුළින් විස්තර කර තිබීම. (ල. 06)

iii. පාසැල් විෂය මාලාවට නර්තනය විෂය ඇතුලත් වීම නිසා නර්තන කලාවේ පැවැත්ම සහ ප්‍රවර්ධනය සිදු වූ බව.
උදා:- 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා නර්තන විෂය පාසැල් විෂය මාලාවට ඇතුලත් කිරීම.
විශ්ව විද්‍යාල අධ්‍යාපනයට නර්තනය ඇතුළත් වීම සහ වර්තමානයේ විෂය පරාසය පුළුල් වීම නිසා සිසුන්ට විෂය හැදෑරීමට හැකි වූ බව.
සෞන්දර්ය ගුරු විදුහල්, විද්‍යාපීඨ කලායතන සංස්කෘතික මධ්‍යස්ථාන මගින් නර්තනයේ පැවැත්ම හා ප්‍රවර්ධනය සිදුවන බව විස්තර කිරීම.
පාසැල් නැටුම් හා නාට්‍ය තරගාවලිය සමස්ථ ලංකා මට්ටමන් පැවැත්වීම බව. ඒ තුළින් ප්‍රවර්ධනය සිදුවන විස්තර කිරීම.
නර්තනය සම්බන්ධ පර්යේෂණ කෘති බිහිවීම මගින් නර්තන කලාවේ පැවැත්මට මහගු රුකුලක් වන බව.
නිර්මාණ නර්තන බිහිවීම ............... යනාදී කරුණු 04 ක් වත් විස්තර කර ලියා තිබීම. (ල. 08)

ප්‍රශ්න 05 කට පිළිතුරු ලිවීමට 20 x 5 = 100